# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2049/22 - 2017 දෙසැම්බර් මස 13 වැනි බදාදා - 2017.12.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට මහනුවර උතුර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ උඩතලවින්න සේවා ජලාශය, ප්‍රවේශ මාර්ගය සහ පොම්පාගාරය ඉදිකිරීම සඳහා විකල්ප ඉඩම් කොටසක අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 29 වැනි දින,<br>
අංක 35, "ලක්දිය මැදුර",<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/1/1332.

### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩතලවින්න ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වෙහෙරගල ගමේ පිහිටි වෙහෙරගල වත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 34 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | ප්‍රවේශ මාර්ගය (ප්‍රාදේශීය සභා මාර්ගය) ; |
| *දකුණට* | : | මහ 2475 මූලික පිඹුරේ කැබලි අංක : 61 ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්* :

01. දිසානායක මුදියන්සේලාගේ දිසානායක මයා<br>
අංක 22,<br>
වෙහෙරගල,<br>
උඩතලවින්න.

02. සහ තවත් අය.

12 - 983

1A - G 26772 — 40 (2017/12)

## 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

### 92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ නෙල්ලිගල සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය සඳහා ඉඩම් කොටසක පරවශතාවය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 29 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1315.

### උපලේඛනය

මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 652 දෙගල්දොරුව ග්‍රාම නිලධාරි වසමේ දෙගල්දොරුව ගමේ පිහිටි (ඉඩමේ නම සොයාගත නොහැක) මේ සමඟ අමුණා ඇති සැලැස්මේ පෙන්නුම් කෙරෙන ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 20 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | එච්. එම්. සෝමාවතී මිය හිමිකම් කියන ඉඩම සහ සේනක බණ්ඩාර මහතා හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | දෙගල්දොරුව අරංගල පොල්ගස්වල දක්වා දිවෙන මාර්ගය ; |
| *දකුණට* | : | සුමේධ කුලසේකර මහතා හිමිකම් කියන ඉඩම, එච්. එම්. ජයරත්න බණ්ඩා මහතා හිමිකම් කියන ඉඩම, එච්. එම්. රණසිංහ බණ්ඩා මහතා හිමිකම් කියන ඉඩම සහ අමරසිංහ මහතා හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | හිජ්ජස්පිටිය සහ බෝධිගල පන්සල දක්වා දිවෙන මාර්ගය. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : ප්‍රාදේශීය සභාව - කුණ්ඩසාලේ,
(දැනට භාවිත වන මාර්ගයකි)

12 - 984

---

## 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

### 92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ගලිගමුව ජල යෝජනා ක්‍රමයේ ජල පොම්පාගාරය හා විදුලි ජනක යන්ත්‍රය ස්ථාපිත කිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2017 නොවැම්බර් මස 29 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1318.

**උපලේඛනය**

කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 76 බී, හැලමඩ ග්‍රාම නිලධාරි වසමේ වරේන්ග්‍රෝව් වත්ත, හැලමඩ ගමේ පිහිටි - කරඳගොල්ල වත්ත නොහොත් හැලමඩ ගොවිපල ඉඩම නමැති ඉඩමෙන් පර්චස් 16 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස් :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස හා මහඔය ; |
| *නැගෙනහිරට* | : | මහඔය ; |
| *දකුණට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස හා මාර්ගය ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* : ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය,
තැ.පෙ. 1746, අංක 40,
නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ - 05.

12 - 985

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.